UNIVERSITY OF CAMBRIDGE INTERNATIONAL EXAMINATIONS
General Certificate of Education Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2007**

**1 hour 30 minutes**

Additional Materials: Answer Booklet/Paper

*2678254266*

**READ THESE INSTRUCTIONS FIRST**

If you have been given an Answer Booklet, follow the instructions on the front cover of the Booklet.
Write your Centre number, candidate number and name on all the work you hand in.
Write in dark blue or black pen.
Do not use staples, paper clips, highlighters, glue or correction fluid.

Answer **all** questions.
At the end of the examination, fasten all your work securely together.
The number of marks is given in brackets [ ] at the end of each question or part question.

This document consists of **4** printed pages and **4** blank pages.

SP (SM/TL) T38888/1
© UCLES 2007
UNIVERSITY of CAMBRIDGE International Examinations

**[Turn over**

BLANK PAGE

## Section A – Translation

**1** Translate into **English**.

තරුණ කාන්තාවක් උයනක වාඩි වී පොතක් කියවමින් සිටියාය. කුඩා ළමුන් දෙදෙනෙක් ගසක් යට බෝලයකින් සෙල්ලම් කරමින් සිටියහ. ඊට ටිකක් ඈතින් ඔවුන්ගේ අම්මලා කතා කරමින් සිටියහ. තමා කියවමින් සිටි පොතටම සිත යොමු වී තිබුණත්, තරුණ කාන්තාවට යමෙකු අඬනවා ඇසුණි. හදිසියේම ලොකු බල්ලෙක් ළමුන් දෙදෙනා ළහින් මතුවිය. ඌ බෝලය පසු පස එළවමින් ළමයින් වටේ දුවන්නට විය. පැහැදිළිවම ළමයි ඉතාමත් බියට පත් වී, අඬන්නට ද පටන් ගත්හ. ඒත් අම්මලා සිටියේ ඔවුන්ගේ ඇඬීම නැසෙන තරම් දුරිනි. ඒ නිසා, ඉක්මනින් නැගී සිටි තරුණ කාන්තාව ඔවුන් වෙත දුව ගියාය. මුදු මොළොක් ලෙස එක් ළමයෙකු වඩා ගත් ඇය අනෙක් ළමයාගේ අතකින් අල්ලාගෙන ඔවුන්ගේ අම්මලා වෙත ගමන් කළාය.

[10]

**2** Translate into **Sinhala**.

We set off early on the first morning of our vacation and headed towards the beach. It was bright and clear and the fishermen were already on the sand taking fish out of the nets and packing them in boxes.

An old man was taking his dog for a walk and said "hello" to us as he passed.

We could see a few small boats out at sea. Birds circled above us in the blue skies, but apart from their noise it was quiet around us.

It was still only five-thirty in the morning and the people would not set out for at least another two hours.

Most people worked close to their homes, and the majority of them were involved in the tourist industry. This meant that they were busier during the two main holiday seasons than the rest of the year.

We had come in the low season, so we were lucky to have the beach and the streets to ourselves for some time yet. It was a different way of life from the hustle and bustle of the large city.

[20]

© UCLES 2007

## Section B – Reading Comprehension

Read the following passage carefully and then answer in **Sinhala** the questions that follow.

අවබෝධය.

බටහිර ඉන්දියානු කොදෙව් පන්දු යවන්නෙකු වූ කර්ට්නි වොල්ෂ්, කඩුලු 519ක් ලබා ගනිමින් මීට පෙර තබා තිබූ වාර්තාව බිඳමින්, මුත්තයියා මුරලිදරන් ලෝකයේ වැඩිම කඩුලු ගණනක් ලබාගත් පන්දු යවන්නා වශයෙන් වාර්තාවක් තබා ඇත. ඔහු මෙම වාර්තාව පිහිටු වූයේ ශ්‍රී ලංකාව හා සිම්බාබ්වේ අතර හරාරේ නුවර පැවති ටෙස්ට් තරඟයේදීය. මුරලිදරන්ගේ මේ දක්‍ෂතාව නිසා ලංකාව ලෝක මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩා කරන ජාතියක් වශයෙන් කීර්තියක් දිනා සිටී. ලෝක වාර්තාව තැබීම ගැන සඳහන් කිරීමේදී, මුරලිදරන් හෙවත් මුරලි, ඉතාමත් දේශමාමක බවක් දක්වා තිබීම විශේෂ කාරණයකි. "ඉන්දියාව හෝ ඕස්ට්‍රේලියාව වගේ නොවෙයි, අපේ රට පුංචියි. මගේ සාර්ථක පන්දු යැවීම නිසා සෙසු ලෝකයා හමුවේ මගේ පුංචි රටට හොඳ ප්‍රතිරූපයක් ගොඩ නැඟෙනවා" මුරලි ප්‍රකාශ කළේය. "එසේම මේ නිසා තරුණ ක්‍රීඩකයන් රාශියක් තුළ උනන්දුව වැඩි වී අනාගතයේදී මේ මට්ටමින් ක්‍රීඩා කිරීමට ඔවුන්ට ද හැකිවනු ඇත. අපේ රට වෙනුවෙන්, ජගත් ශූරයින් වීමට ඔවුන්ට අවශ්‍ය වනු ඇත."

කෙසේ වෙතත්, මුරලි තවමත් සිතන්නේ 1996 දී ලෝක ශූරතාව දිනාගැනීම ඔහුට ඉතාමත් අනුස්මරණීය සිද්ධිය බවයි. ඔහු කොතරම් ජයග්‍රහණ ලබා තිබුණත් මුරලිගේ පන්දු යැවීම මතභේදවලට තුඩු දී ඇත. ඔහුගේ පෞද්ගලික පන්දු යැවීමේ විලාසය, මේ ක්‍රීඩාවට සම්බන්ධ සමහරුන් සලකන්නේ "පන්දුව දමා ගැසීමක් " ලෙසය. එය මේ ක්‍රීඩාවේ නීතිවලට අනුකූල නොවන, පන්දු යවන විලාසයකි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජාත්‍යන්තර ක්‍රිකට් සම්මේලනය ඉදිරියේ පරීක්‍ෂණයකට පෙනී සිට ඔවුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට මුරලිට සිදු විය. එසේම ඔහු පන්දු යවන ආකාරය ක්‍රීඩාවේ සම්මත ක්‍රමවලට අනුකූලදැයි තීරණය කිරීම සඳහා ක්‍රීඩා විද්‍යාඥයින් විසින් පවත්වන ලද පරීක්‍ෂණවලට මුහුණ දීමට ද ඔහුට සිදු විය. නීති විරෝධී ක්‍රීඩා විලාසයක් පිළිබඳව නැගෙන සියලු චෝදනාවලින් තමන් නිදහස් වන බවට දැඩි විශ්වාසයකින් යුතුව මුලු පරීක්‍ෂණය පුරාම මුරලි සිටියේය. දේශීය වූත් ප්‍රාදේශීය වූත් අසීමිත ක්‍රීඩා ලෝලීන් සමඟ, ඔහුගේ සහෝදර ක්‍රීඩකයින් හා කණ්ඩායමේ නායකයා ද හැම විටම මුරලිට දැඩි සහයෝගයක් දක්වමින් සිටිය ද, 2004 නොවැම්බර් මාසයේදී, කොමිසමේ වාර්තාව ප්‍රකාශයට පත් වූ විට, මුරලි නිවැරදි බව ඔප්පු විය. මුරලිගේ පන්දු යැවීම පැහැදිලිවම 'අමුතුවෙන් කැපී පෙණුනත්' එය සම්පූර්ණයෙන්ම ක්‍රීඩාවේ නීතිවලට අනුකූල බව කොමිසම ප්‍රකාශ කළේය.

මුරලි, ජනමාධ්‍යවේදීන් සමඟ සම්මුඛ සාකච්ඡාවලදී සාමාන්‍යයෙන් ලජ්ජාශීලී බවක් හා සැක සහිත බවක් දක්වයි. එහෙත් ඔහුගේ කණ්ඩායමේ සාමාජිකයන් කියන පරිදි ඔහු ප්‍රබෝධමත්, කැපවීමකින් යුතු හා සෙස්සන් දිරිමත් කරන්නා වූත් පෞරුෂයකින් යුත් අයෙකු මෙන්ම, තම කණ්ඩායම ක්‍රීඩා කරන ආකාරය පිළිබඳව තම අදහස් නොසඟවා ප්‍රකාශ කරන්නෙකි. පොදුවේ ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව හා තම පළාතේ මෙන්ම ජාතික මට්ටමේ

කණ්ඩායම්වල සාර්ථකත්වය කෙරෙහි මුරලිගේ කැපවීම හා උනන්දුව ජීවිත කාලය පුරාම කිසිවිට හීන වී නැත. ඔහු තවමත් පන්දු යැවීම පුහුණු වීම සඳහා කොතරම් පැය ගණනක් ගත කරන්නේ ද යන්න හා, ක්‍රීඩාවේ සෑම අංශයකින්ම ඔහු කොතරම් වින්දනයක් ලබන්නේ ද යන්නත් නරඹන්නන්ගේ අවධානයට යොමු වී ඇත.

මේ මට්ටමින් කැපවීම නිසා තමාට කොතරම් වෙහෙසක් ඇති වී තිබේදැයි, 2007, කැරිබියන් දූපත්වලදී පැවැත්වෙන ලෝක ශූරතා තරඟයෙන් පසු තමා ක්‍රීඩාවෙන් සමුගැනීමට බලාපොරොත්තු වන බව මුරලි ප්‍රකාශ කර තිබීමෙන් පෙනී යයි. කවදත් උසස් බලාපොරොත්තු වලින් යුත් මුරලි කියා ඇත්තේ 'උච්ච ස්වරයකින්' තම ක්‍රීඩා දිවියෙන් සමුගන්නා බවය. මෙය සෙසු කණ්ඩායම්වල ක්‍රීඩකයන්ට අනතුරු ඇඟවීමකි.

Now answer the following questions in **Sinhala** using your own words as much as possible.

**1** මුරලි මෑත දී බිඳහෙලූ වාර්තාව කුමක්ද? [1]

**2** මුරලි "සවභාවයෙන්ම දේශහිතෛෂී" යයි කීමෙන් කතුවරයා අදහස් කරන්නේ කුමක්ද? [1]

**3** වාර්තා බිඳ හෙළමින් තමා ලැබූ ජයග්‍රහණයක් ශ්‍රී ලංකාවට හොඳ බවට මුරලිගේ කීම සඳහා හේතු 2ක් දක්වන්න [2]

**4** තමාගේ වාර්තාව තමන්ම බිඳ හෙලීමටත් වඩා ලෝක ශූරතාව දිනීම වැදගත් යයි මුරලි සිතුවේ මන්ද? [2]

**5** මුරලිට විරුද්ධ චෝදනාවලට හේතුව ඔබේ වචන වලින් විස්තර කරන්න [2]

**6** ක්‍රීඩා විද්‍යාඥයින් ලවා මුරලි පරීක්ෂා කරවනු ලැබුවේ මන්ද? [2]

**7** ආරවුල පැවති අවස්ථාවේ මුරලිට උදව් කළේ කව්ද? [3]

**8** මුරලිගේ පන්දු යැවීම "අමුතුවෙන් කැපීපෙනෙන" දෙයක් ලෙස ජාත්‍යන්තර ක්‍රිකට් කොමිසම හැඳින්වීමෙන් අදහස් වන්නේ කුමක්ද? [3]

**9** මෙම පාඨයට අනුව මුරලිගේ පෞරුෂය පිළිබඳව අපට දැන ගත හැක්කේ මොනවාද? [4]

**10** මුරලි ශ්‍රී ලංකා කණ්ඩායමට හොඳ නායකයෙකු වේ යැයි ඔබ සිතන්නේද? [3]

**11** 2007 සඳහා මුරලිගේ අපේක්ෂා කවරේද? දෙකක් නම් කරන්න [2]

© UCLES 2007

BLANK PAGE

© UCLES 2007 

**BLANK PAGE**

**BLANK PAGE**

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

University of Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.

© UCLES 2007